Page 2 October 2010.qxd 19/10/2010 05:23 Page 1




# ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND


*Phone* : 02074289388
*Fax* : 08719005163
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal

ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

## දකුණේ මිනිස්සු!

ගිය සතියේ අප රටේ යුද්ධාධිකරණය ජෙනරාල් සරත් ෆොන්සේකාට මාස 30ක සිර දඬුවමක් නියම කළා ය. සති අග පුවත්පත් කීපයකම කතුවැකි ලියා තිබුණේ ඒ තීන්දුවේ හොඳ නරක විග්‍රහකිරීමටය. යුද අධිකරණයේ තීන්දුවට මූලිකවූ කරුණුවල නීතිමය බැරෑරුම් කම මා සොයා නොබැලූ නමුත් තීන්දුව සම්බන්ධයෙන් කිසිවක් අද මෙහි ලිවිය යුතුයයි සිතුවේ එම පුවතේ මූලික වටිනාකම වටහා ගැන්මෙන් පසුව ය. මේ මට සිතෙන සැටි ය.

ජෙනරාල් ෆොන්සේකා යුදවීරයෙකු බව සැබෑය. කොටි ත්‍රස්තවාදීන් සමූලඝාතනය කරමින් යුද ජයග්‍රහණය කරා අපේ දේශය ගෙන එන්නට අප විකුමැති ත්‍රිවිධ හමුදා මෙහෙය වූ සේනාංකයන්හි පෙරමුණේ සිටියේ ඔහු ය. ඔහුගේ අනුකම්පා විරහිත දෘඩත්වය එවැනි සටනකට අවශ්‍යව තිබුණු දෙයකි. ලන්ඩනයේ හයිඩ්පාක් හි ඉදිකර ඇති එංගලන්තයේ යුද වීරයෙකු සේ සැලකෙන වෙලිංටන් ආදිපාදවරයාගේ පිළිරුව මෙන් කිසියම් දිනක ශ්‍රීලංකාවේ නිදහස් චතුරශ්‍රයේ ජෙනරාල් ෆොන්සේකාගේ පිළිරුවක් නිසැකව ඉදිවනු ඇතැයි මගේ කල්පනාව විය. යුද්ධය දිනූ දිනවල අප දේශප්‍රේමී බොහෝ දෙනෙකුද එසේ සිතා සිටි බව මට පසක් විය. එහෙත් කාගේත් ඒ බලාපොරොත්තු සියල්ල වතුරේ ගසාගෙන යමින් යුද්ධය අවසන් වී මාස තුනක් යන්නටත් මත්තෙන් කිසිවෙකු නොසිතූ විරූ අවාසනාවන්ත තත්වයක් අප රට තුළ ඉස්මතු වූයේ ය. ඒ සිදුවීම් තුළින් මට වහා පෙනුණේ ජෙනරාල් පොන්සේකාගේ අතිශය මෝඩකමය. ලංකාවට සතුරු වූ ප්‍රතිගාමීන්ගේ උගුලේ ඔහු වැටුණේ ය. තමා ත්‍රිවිධ හමුදාවේ ම නායකයා බවට පත්කළ රටේ නායකයාට එරෙහිව ඔහු අභියෝග කළේය. යුද හමුදාවේ කාර්යයන් හැර තමාට දේශපාලන හෝ රාජ්‍ය පාලනයේ කිසිදු දැනුමක් නැති බව දැන දැනම තමා ලංකාව පාලනය කරන්නට වඩා සුදුස්සායයි සිතුවේ මක්නිසාද? එසේම සුදු කොඩි ඔසවන් අභය ඉල්ලා පෙරට ආ කොටි නායකයන් පිරිසක් මරා දමන ලෙස ආරක්ෂක ලේකම් ගොඨාභය රාජපක්ෂ හමුදා නිලධාරීන්ට අණදුන් බව ජෙනරාල් ලෝකයාටම ඇසෙන්නට කියා තමා ජාත්‍යන්තර යුධ අධිකරණයකදී වුවද ඒ සම්බන්ධයෙන් සාක්කි දීමට ඉදිරිපත්වන බව ද කීම හමුදා ප්‍රධානියා ලෙස සුදුසු ක්‍රියාවක් ද? යුද්ධය දිනන්ට මූලික වූ ඔහුම අපේ ඒ ජයග්‍රාහී සේනාංකයන්හි සහ ජයග්‍රහණයේ දැළි ගා කැත කළේ ය.

මාස 30ක සිර දඬුවමකට ජෙනරාල් පොන්සේකා නියම විය. ඔහුට සමාවක් දිය හැකිව තිබුණේ ජනපති මහින්දට ය. සමාව ඉල්ලුවානම් සමාව දෙන බව ජනපති නොකියා කියා ඇත. එහෙත් ජෙනරාල් කාටවත් පාච්චල් වනු නැතැයි දන්නා අය කියති. එසේම ජනාධිපතිවරයා ද නොනැමෙන පුද්ගලයෙකු බව කවුරුත් දැන සිටිති. ඒ දෙදෙනා ම දකුණු පළාතේ අයයි. ඒ නොනැමෙන ගතිය දකුණු පළාතට විශේෂ වූවක්ද? එසේ විය හැකිය. අවසානයේ ඉන් කෙනෙකු නැමෙන්නේ නම් ඒ කොයි කෙනා විය හැකිදැයි අපි බලා සිටිමු.



## පර්වත, වෘක්ෂ හා මනුෂ්‍ය ජීවිත

**හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා පංචහි වඩ්ඪහි වඩ්ඪන්ති**

අංගුත්තර නිකායේ පංචක නිපාතයේ මහාසාල සූත්‍රයේ දැක්වෙන ඉහත පාඨයේ අදහස වන්නේ, මහණෙනි, හිමාල පර්වත රාජයා නිසා මහා ගස්වල කොටස් පහක වර්ධනයක් ඇතිවේ යන්නයි. උපමා භාවිතාකොට ශ්‍රාවකයාට කරුණු අවබෝධකරවීමට බුදුරජාණන් වහන්සේ ගත් උත්සාහය ත්‍රිපිටක සාහිත්‍යය අධ්‍යනය කිරීමේදී මැනවින් දක්නට ලැබෙයි. මෙම මහාසාල සූත්‍ර දේශනාව මගින්ද උපමාවක් භාවිතා කොට වැඩිහිටියන් තුළ ගුණධර්ම පහක් වර්ධනය කරගැන්මට අවශ්‍යතාව පැහැදිලි කරයි. උපමාව වන්නේ හිමාල පර්වත රාජයා නිසා එහි මහා ගස්වල කොටස් පහක වර්ධනයක් ඇතිවීමයි. එම කොටස් පහ මෙසේ දැක්වේ.

1. මහගස්වල අතු කොළ දළු මල් ගෙඩි හටගෙන වර්ධනයවීම.
2. පොත්ත වර්ධනය වීම.
3. සිවිය වර්ධනයවීම.
4. ඵලය වර්ධනයවීම
5. අරටුව වර්ධනයවීම.

මහණෙනි, ඒ ආකාරයෙන්ම ශ්‍රද්ධාවන්ත ගුණගරුක පුද්ගලයන් නිසා ඒ ආශ්‍රයේ හැදෙන වැඩෙන ජීවත්වන අයද ගුණධර්ම පහක වර්ධනයක් ඇතිකරගන්නේයයි බුදුන්වහන්සේ දේශනා කළහ. ඒ වර්ධනය වන ගුණධර්ම පහ මේවා වෙති.

ශ්‍රද්ධාව, ශීලය, බහුශ්‍රැතබව, පරිත්‍යාගශීලී බව සහ ප්‍රඥාවයි

හිමාල වනයේ ගස්මෙන් නිවසක, ආයතනයක, සමාජයක, නායකත්වය දරණ අය මව්පියන්, වැඩිහිටියන් ආදීන් ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, චාග, පඤ්ඤා යන ගුණ ධර්ම වලින් පෝෂණය වන්නේද, ඒ අනුව ජීවත් වන්නේද, ඒ ආශ්‍රයේ ජීවත්වන දරුවෝ, ඥාතීහු හා හිතවත්තුද එම ගුණධර්ම අනුව කටයුතුකිරීමට පෙළඹෙති.

ශ්‍රද්ධාවන්තයා හඳුනාගැන්මට හැකි ලක්ෂණ තුනක් බුදුරජානන් වහන්සේ දේශනා කර ඇත. සිල්වත් අය දැක්මට ආශ්‍රයට කැමැත්තක් දැක්වීම, ධර්මය ශ්‍රවණයට කැමතිවීම, මසුරු මළ දුරුකර පරිත්‍යාගයට කැමතිවීම, තෙරුවන් පිළිබඳ කරුණු දැන අවබෝධයෙන් කටයුතුකිරීම නියම ශ්‍රද්ධාවයි.

හික්මීම, සංවරකම, හැදිච්චකම, ශීලයයි. කයින් හා වචනයෙන් කෙරෙන වැරදි වලින් වැළකීම සීලයයි. සීලයෙන් තොර පුද්ගලයා බුදුහාමුදුරුවන් උපමා කර ඇත්තේ සොහොනක දක්නට ලැබෙන් අපිරිසිදුබව, දුගඳ පැතිරීම ආදී ලක්ෂණ වලටයි. ශ්‍රැතවත් බව යනු ධර්මය බොහෝ අසා ධාරණයකර ගැන්මයි. ධර්මය දැන ඒ අනුව ජීවත්වන පුද්ගලයා එළඹෙන ඕනෑම අවස්ථාවකට මුහුණදෙන්නේ ධර්මය අනුවයි. ඔහු සාර්ථක ජීවිතයක් ගතකරයි. වැඩිහිටියන් පරිත්‍යාගශීලී වනවිට ඒ ආශ්‍රයේ සිටින අන් අයද පරිත්‍යාගයට පෙළඹෙන අයුරු පැහැදිලි ලක්ෂණයකි.

තමා සතු යමක් දී සතුටක් ලැබිය හැකිනම් එය කඩුවක් ගිලිනවාට වඩා අපහසු කටයුත්තක් බව එක් පුරෝහිත බමුණෙකු විසින් රජෙකුට කරන ලද ප්‍රකාශයකි. මිනිසාට තිබෙන උතුම්ම රත්නය ප්‍රඥාව බව පඤ්ඤා නරානං රතනං යන්නෙන් පැහැදිලි වේ. ලෞකික හා ලෝකෝත්තර ජීවිත සාර්ථක කරගැන්මට ප්‍රඥාව ඉවහල් වේ. ශ්‍රද්ධා ශීල ආදී ගුණධර්ම වලින් යුක්තව කටයුතු කළ චිත්ත ගෘහපතියා යන යන සෑම තැනකදීම පිදීමට ලක්විය. වැඩිහිටි ඔබ අප හැම මෙම ගුණධර්ම වලින් පෝෂණය වන්නට අධිෂ්ඨාන කරගනිමු.

♦ ***ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය අඹගමුවේ සෝරත හිමි ලන්ඩන් බෞද්ධ විහාරය***

## Religions should face investigation

" Experience is the only source of knowledge. The same methods of investigation which we apply to the sciences and to exterior knowledge should be applied to religion.

If a religion is destroyed by such investigation, it means that religion is nothing, but a useless and unworthy collection of superstitious beliefs; the sooner it disappeared, the better. Why religions should claim that they are not bound to abide by the standpoint of reason no one knows…..it is better that mankind should become atheist by following reason than blindly believing in two hundred million gods on the authority of anybody….."

**- Swami Vivekananda**

## ආගම් තර්කානුකූල විමසුමට ලක්විය යුතුය


" අත්දැකීම දැනුම ලැබීමට ඇති එකම මූලාශ්‍රය වෙයි. අප විද්‍යාවට හා බාහිරින් ලබා ගන්නා දැනුම ලැබීමට යොදන පරීක්ෂණ ක්‍රම ආගම ගැන විමසීමේදී ද භාවිතා කළ යුතුය. එසේ පරීක්ෂණයට භාජනය කරද්දී යම් ආගමක් විනාශයට පත් වේ නම් ඉන් හැඟෙන්නේ ඒ ආගම කිසි ප්‍රයෝජනයක් නැති, නොවටිනා, මිත්‍යා ඇදහිලි එකතු කර තැනූ පුහු ආගමක් බවයි. එවැනි ආගමක් අතුරු දහන්ව ගිය තරමට හොඳය. තර්කානුකූල පරීක්ෂාවන්ට භාජනය වන්නට තමන් බැඳී නැතැයි ආගම් ප්‍රකාශකර සිටින්නේ ඇයි දැයි කිසිවෙක් නොදනිති. දැනමුත්තන්ගේ කීම දොහොත් මුදුණින් පිළිගනිමින් අන්ධයින් ලෙස තිස්තුන් කෝටියක් දෙවිවරුන් අදහනවාට වඩා, මිනිස් වර්ගයා, සාධාරණ තර්කානුකූල බුද්ධිය අනුගමනය කරමින් දේව විශ්වාසය අත්හැරීම නුවණට හුරු ය."

***- ස්වාමි විවේකානන්ද***

# The wrong Road
# වැරදි පාර

**A** wandering ascetic, having heard of the Buddha, travelled everywhere looking for him. One night he came to stay in a house where the Buddha was also staying but, not knowing the Buddha's physical appearance he was unaware of his presence.

The next morning he arose and continued his way, still searching for the Buddha. The search for peace and enlightenment without correct understanding is like this.



Due to lack of understanding of the truth of suffering and its elimination all subsequent factors on the path will be wrong- wrong intentions, wrong speech, wrong actions, and wrong practice of concentration and tranquillity. Your likes and dislikes are not a trustworthy guide in this matter either, although foolish people may take them for their ultimate reference.

Alas, it is like travelling to a certain town - you knowingly start out on the wrong road, and since it is a convenient one, you travel it in comfort. But it will not take you where you want to go.

**නො**යෙක් කරුණු නිසා ජීවිතය ගැන කළකිරී සත්‍යය සොයනු පිණිස නානා දිසාවන්හි අරමුණක් නැතිව ඇවිද යන තරුණ බමුණෙකුට වරක් බුදුන්වහන්සේ ගැන අසන්නට ලැබිණ. උන්වහන්සේගෙන් විමුක්තිය ලැබිය හැකියයි බොහෝ දෙනා පැවසූ නිසා ඉන් පැහැදුණු ඔහු බුදුන්වහන්සේ සොයමින් නොයෙක් දිසාවන්හි ඇවිදින්නට වීය. එසේ ඇවිද යද්දී එක් රාත්‍රියක ඔහු ගමක එක්තරා ශාලාවක නවාතැන්ගත්තේය.

එදාම බුදුන්වහන්සේ ද ඒ ශාලාවේ ම කුටියක වැඩ සිටිය නමුත් තරුණ බමුණා එබව නොදත්තේ ය. කිසි දිනක දැක නොතිබුණු බැවින් ගෞතමයන්ගේ ශාරීරික හැඩරුව කිසිවක් බමුණා නොදත්තේය. ඔහු පසුදා උදයේ ඒ ශාලාවෙන් නික්ම යන්නට ගියේය.

තමා කරන්නට යන දෙය පිළිබඳ සැබෑ වැටහීමකින් තොරව කිසිවෙකු විමුක්තිය හා සත්‍යය අවබෝධ කිරීමට තැත්කිරීමද ඉහතකී පුවතට සමානය.

මූලික වශයෙන් දුක යනු කුමක්දැයි හරිහැටි අවබෝධකර ගත්තේ නැත්නම් එය නැතිකරන මාර්ගයට පිවිසෙන සියළු ක්‍රමවේද, සාධක වැරදී යනු නියතය. වැරදි චේතනාව, වැරදි කථාව, වැරදි ක්‍රියා සහ වැරදි ලෙස ප්‍රගුණ කිරීම යන මේ සියල්ල කෙළවර වන්නේ වැරදි අවසානයකය. මෙතැන්හිදී සාමාන්‍යයෙන් ඔබ කැමති අකමැති දේ අනුව ක්‍රියා කරන්නට සිතන්නේ නම් ඒවා කිසිසේත් ඔබ හරි දෙසට යොමුකරන මාර්ගෝපදේශකයන් නොවන බව තේරුම්ගන්න. එහෙත් මෝඩ අය එවැනි දේ අනුගමනය කරනවා ඇත.

අහෝ! එය හරියට නගරයකට යාම සඳහා දැන දැනම වැරදි පාරකට බසිනවා වැනි ක්‍රියාවකි. ඒ පාර ඔබ හොඳින් දන්නා, ඇවිදින්නට පහසු එකක් විය හැකි ය. එහෙත් එය ඔබ අවශ්‍ය නගරයට ගෙන යන්නේ නැත.

♦ **Ven. Achaan Chah පූජ්‍ය චා හිමියෝ**


**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

*Colombo Office*
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632